**ඇබ්බැහිවීම පිළිබඳ මනෝවිද්‍යාව සහ පුනරුත්ථාපනය ඩිප්ලෝමා පාඨමාලාව**
**2023 - තෙවනි කාණ්ඩය**

දර්ශනය හා මනෝවිද්‍යා අධ්‍යයනාංශය

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**අයදුම්කරුවන් සඳහා මූලික තොරතුරු සහ පොදු උපදෙස්**

(01) මේ සමග අමුණා ඇති අයදුම්පත්‍රය නිසි පරිදි සම්පූර්ණ කොට 2023 ඔක්තොම්බර් 10 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ **"පාඨමාලා සමායෝජක, ඇබ්බැහිවීම පිළිබඳ මනෝවිද්‍යාව සහ පුනරුත්ථාපනය ඩිප්ලෝමා පාඨමාලාව, දර්ශනය හා මනෝවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් බාරදිය යුතුය. නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත්‍ර කිසිදු හේතුවක් මත හෝ සලකා බලනු නොලැබේ.

(02) පාඨමාලා ගාස්තු සහ අනෙකුත් ගාස්තු

පාඨමාලා ගාස්තුව - රු 75000.00 (මෙම ගාස්තුව වාරික දෙකකින් ගෙවිය හැකිය. මුල් වාරිකය වන රු. 50000.00 මුදල ලියාපදිංචි වීමේදී ගෙවිය යුතුය. )

අයදුම්පත් ගාස්තුව - රු 500.00 (මෙම ගාස්තුව ඕනෑම මහජන බැංකු ශබාවකින් **013010001587** දරන ගිණුමට ගෙවා එම රිසිට්පත අයදුම්පත අනිවාර්යයෙන් එවිය යුතුය.)

විභාග ගාස්තු - රු 1500.00

(03) අ.පො.ස. උසස් පෙළ හෝ පිළිගත් ආයතනයකින් පැවැත් වූ NVQF 4 මට්ටමේ ඕනෑම උසස් සහතික පත්‍ර පාඨාමාලාවක් සමත් වීම පාඨමාලාව සඳහා ඉල්ලුම් කිරීමට අවම සුදුසුකම් වේ.

(04) අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා තිබිය යුතු අතර සම්මුඛ පරීක්ෂණයේදී අදාළ ලේඛනවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

1. උප්පැන්න සහතිකයේ පිටපත
2. ජාතික හැඳුනුම්පතේ පිටපත
3. උසස් පෙළ හෝ නියමිත සහතික පිටපත්

(05) සම්මුඛ පරික්ෂණයෙන් පසු ඔබව පාඨමාලාවට තෝරාගනු ලැබුව හොත් ඒ බව ඔබට ලිඛිතව දැනුම් දෙන අතර පාඨමාලා ගාස්තු ඉන් අනතුරුව ගෙවිය යුතුය.

(06) පාඨමාලාව ඉරිදා දිනවලදී පෙ.ව. 8.00 සිට පැවැත්වෙන අතර මාර්ගගතව හා විශ්වවිද්‍යාලය තුළදී දේශන පැවැත්වේ. ඒ පිළිබඳ සියලු තීරණ පාඨමාලා සමායෝජක විසින් ක්‍රියාත්මක කරන අතර අපේක්ෂකයන් එම තීරණවලට එකඟ වියයුතුය.

(07) පාඨමාලාව වසරක කාලයක් පැවැත්වෙන අතර සමාසික දෙකක් ලෙස එය කොටස් කරනු ලැබේ.

| පළමු සමාසිකය | දෙවන සමාසිකය |
|---|---|
| DAP 111<br>ඇබ්බැහිවීම පිළිබඳ මනෝවිද්‍යාව හැඳින්වීම | DAP 121<br>පුනරුත්ථාපන ප්‍රතිකාර සහ මනෝවිද්‍යාත්මක උපදේශන ක්‍රියාවලිය |
| DAP 112<br>අසාමාන්‍ය චර්යා | DAP 122<br>පුනරුත්ථාපනය හා ආධ්‍යාත්මික රැකවරණය |
| DAP 113<br>මනෝමිතිය හා ඇගයීම | DAP 123<br>පුනරුත්ථාපන ආචාරධර්ම සහ වෘත්තීය ආචාරධර්ම |
| DAP 114<br>සමාජ පුනරුත්ථාපනය | DAP 124<br>පර්යේෂණ ක්‍රමවේදය |
| DAP 115<br>නැවත ඇබ්බැහිවීම වැළැක්වීම | DAP 125<br>පර්යේෂණ වාර්තාව |

(08) සියලු දේශන පවත්වනු ලබන්නේ විශ්වවිද්‍යාලයීය ආචාර්ය මණ්ඩලය හා බාහිර සම්පත්දායකයන් විසිනි.

(09) පාඨමාලාව උදෙසා ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා සඳහා යන වියදම් හෝ ගාස්තු පාඨමාලා ගාස්තුවට ඇතුළත් නොවේ.

(10) පාඨමාලාවට සම්බන්ධ වන සියලු දෙනා විශ්වවිද්‍යාලයීය විභාග නීති සහ අනෙකුත් නීති පිළිගත යුතු අතර, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය ඩිප්ලෝමා අපේක්ෂකයෙකු ලෙස විශ්වවිද්‍යාලයේ කීර්තිනාමය රැකෙන අයුරින් කටයුතු කළ යුතුය.

ආචාර්ය ආශා නිමාලි ප්‍රනාන්දු

පාඨමාලා සමායෝජක

ඇබ්බැහිවීම පිළිබඳ මනෝවිද්‍යාව සහ පුනරුත්ථාපනය ඩිප්ලෝමා පාඨමාලාව

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

දර්ශනය හා මනෝවිද්‍යා අධ්‍යයනාංශය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

2023/09/18